# හොඳ යාළුවෝ



ඊ.ජී. දැහැමි තීක්ෂණා

i

# හොඳ යාළුවෝ

ඊ.ජී. දැහැමි තීක්ෂණා

**2 - E**

ISBN : 978624-206-845-9

**ප්‍රකාශක : මහමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

**2023**

# පිදුම

මෙම පොත සෑදීමට

මා හට මඟ පෙන්වූ

චාමිනී පල්ලියගුරු ගුරු මෑණියන්ටත්,

මාගේ ආදරණීය දෙමාපියන්ටත්

මෙම පොත

ගෞරවයෙන් පුද කරමි!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20



එකෝමත් එක කැලෑවක හොඳ යාළුවෝ දෙන්නෙක් හිටියා. අලි පැංචයි හා පුංචයි.


හා පුංචාට ගඟේ නාන්න ආසාවක් ඇති වුණා.

ඉතින් හා පූංචා එයාගේ
හොඳම යාළුවා වූ අලි
පැංචාට කතා කරලා මේ
ආසාව ගැන කිවුවා. ඒත් අලි
පැංචා කැමති වුනේ නැහැ.







මොකද ගඟේ වතුර සැර නිසා. යාළුවේ අපි තවම හරිම පුංචි ළමයිනේ. තනියම ගඟට නාන්න යන්න හොඳ නෑ කියලා අලි පැංචා කිව්වා.



ඒත් හා පූංචා අලි පැංචා
කිව්ව දේ අහන්න කැමති
වුණේ නැහැ. අනේ යාළුවේ
අපි පරිස්සමින් ගඟට බැහැලා
නාමු හා පූංචා අලි පැංචාට
කරදර කරා.

අලි පැංචා යාළුවාගේ හිත
රිදවන්න කැමති වුණේ
නැහැ. ඒ හින්දා අලි පැංචා
ගඟේ නාන්න කැමති වුණා.
‘‘මං කියන දේ අහනවනම්
ගඟේ නාමු’’.





යාළුවේ අපි ඈතට යන්නේ නැතිව ඉවුර ළඟින් නාමු මං ඔයා ළඟින් ඉන්නම්. ඔයා ඉතින් පුළුන් බෝලයක් වගේනේ මගේ යාළුවේ.




යාළුවෝ දෙන්නා නාන්න
ගඟට බැස්සා. අලි පැංචා
යාළුවා ළගටම වෙලා හිටියා.
හා පුංචාට ඇතට යන්න
දුන්නේ නෑ.

අලි පැංචා දැක්කා ගඟේ වතුර පාර වැඩි වුණා. අලි පැංචා එයාගේ යාළුවා ගැන හොඳ අවදානයෙන් හිටියා.




එක පාරටම හා පූංචා ගහේ ගහගෙන ගියා. හා පූංචා කෑ ගහන්න ගත්තා. අනේ යාළුවේ මං ගහගෙන යනවා. මාව බේර ගන්න.






අලි පැංචාට බය හිතුණා. යාළුවාට කරදරයක් වෙයි කියලා. අලි පැංචා දෙපාරක් නොහිතා හා පූංචා ඉන්න තැනට පැන්නා.

එයාගේ දිග හොඬ වැල දාලා හා පූංචා අරං පිට උඩ තියා ගත්තා. හා පූංචා හොඳටම බය වුණා. අලි පැංචා හා පූංචාගේ බය නැති කළා.





ඔයා බය වෙන්න එපා මගේ යාළුවේ. ඔයාට මොකුත් වෙන්නේ නෑ මං ඉන්නවා ඔයා ළඟ. අලි පැංචා කිවුවා. හා පූංචා යාළුවාට තුරුලු වුණා.



ඔයා තමයි මගේ ජීවිතේ
බේරා ගත්තේ මගේ යාළුවේ.
හා පූංචා කිවුවා.



එහෙම තමයි හොඳ යාළුවෝ වුනාම මගේ යාළුවේ. අලිපැංචා කිව්වා.

අපිත් හොඳ යාළුවෝ වාගේ එකිනෙකාට උදව් කරමු.

# නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20